ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

# ප්‍රධාන සන්නිවේදන නිලධාරී (කොන්ත්‍රාත් පදනම මත)

## 1.1 රැකියා භූමිකාව :

ප්‍රධාන සන්නිවේදන නිලධාරියා ශ්‍රී ලංකා මහ බැංකුවේ කීර්තිය ඉහළ නැංවීම, එහි ප්‍රතිපත්ති, තීරණ සහ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විනිවිදභාවය පවත්වා ගෙන යෑම සහ එම ප්‍රතිපත්ති, තීරණ සහ ක්‍රියාකාරකම් සාමාන්‍ය ජනතාව, මාධ්‍ය, මූල්‍ය ආයතන, රාජ්‍ය ආයතන සහ ජාත්‍යන්තර සංවිධාන ඇතුළු විවිධ පාර්ශ්වකරුවන් වෙත ඵලදායී ලෙස සන්නිවේදනය කිරීම සඳහා ක්‍රමෝපායික සංවර්ධනයට නායකත්වය ලබා දීම සහ සන්නිවේදන මූලාරම්භයන් ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු ය.

## 1.2 රැකියාව/ රැකියාවේ වගකීම් :

- **ක්‍රමෝපායික සන්නිවේදනය සහ සැලසුම්කරණය:** ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉලක්ක සහ ප්‍රමුඛතාවන්ට අනුකූල වන විස්තීර්ණ සන්නිවේදන ක්‍රමෝපායන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම. ඉලක්කගත ග්‍රාහක පර්ශ්වයන් වෙත ඵලදායී ලෙස ළඟා වීමට ප්‍රධාන පණිවුඩකරණ තේමා සහ නාලිකා හඳුනා ගැනීම.
- **මාධ්‍ය සබඳතා:** දේශීය, ජාතික සහ ජාත්‍යන්තර මාධ්‍ය ආයතන සමඟ ශක්තිමත් සබඳතා ගොඩනගා ගැනීම සහ පවත්වාගෙන යෑම. මාධ්‍ය විමසීම්, සම්මුඛ සාකච්ඡා සහ මාධ්‍ය සාකච්ඡා හසුරුවන ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රධාන ප්‍රකාශක ලෙස කටයුතු කිරීම. නිවැරදි තොරතුරු බෙදා හැරීමට සහ බැංකුවේ කීර්තියට ඇති විය හැකි මතු අවදානම් වැළැක්වීමට සහ කළමනාකරණය කිරීමට දූරදර්ශීව මාධ්‍යවේදීන් සමඟ කටයුතු කිරීම.
- **බාහිර සන්නිවේදනය:** සාම්ප්‍රදායික සහ සාම්ප්‍රදායික නොවන මාධ්‍ය සහ අනෙකුත් උපක්‍රම භාවිත කරමින් හඳුනාගත් පාර්ශ්වකරුවන් සහ ඉලක්කගත ග්‍රාහක පර්ශ්වයන් වෙත තොරතුරු පැහැදිලි ලෙස ලබා දීම.
- **අභ්‍යන්තර සන්නිවේදනය:** සංගත පණිවුඩකරණය සහ දෙපාර්තමේන්තු හරහා ඊට අනුකූල වීම තහවුරු කිරීමට ගනු ලබන අභ්‍යන්තර සන්නිවේදන ප්‍රයත්නයන් අධීක්ෂණය කිරීම. කාර්යමණ්ඩල සාමාජිකයින්, ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ පාර්ශ්වකරුවන් අතර ඵලදායී තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා සන්නිවේදන ක්‍රියාපිළිවෙත් සංවර්ධනය කිරීම.
- **මහජන සම්බන්ධතා:** රජයේ නියෝජිත ආයතන, මූල්‍ය ආයතන, කර්මාන්ත සංගම් සහ ප්‍රජා කණ්ඩායම් ඇතුළු ව අදාළ පාර්ශ්වකරුවන් සමඟ සබඳතා වර්ධනය කිරීම. පොදු උත්සව, සම්මන්ත්‍රණ සහ සංසදවලදී ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කිරීම හා එහි කාර්යභාරයන් සහ කාර්යයන් පිළිබඳ දැනුවත් කිරීම සහ අවබෝධය වැඩිදියුණු කිරීම
- **අර්බුද සන්නිවේදනය:** අනපේක්ෂිත සිදුවීම් හෝ හදිසි අවස්ථා සඳහා ක්ෂණිකව හා සඵලදායී ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා ශක්තිමත් අර්බුද සන්නිවේදන සැලසුම් සහ ක්‍රියාපිළිවෙත් සංවර්ධනය කිරීම. අර්බුදකාරී අවස්ථාවන්හි දී සන්නිවේදනය කළමනාකරණය කිරීම සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ කීර්තියට අදාළ ව ඇති විය හැකි අවදානම් අවම කිරීම සඳහා අදාළ දෙපාර්තමේන්තු සමඟ සම්බන්ධීකරණය කිරීම.
- **මාධ්‍ය අන්තර්ගත සංවර්ධනය:** මාධ්‍ය නිවේදන, දේශන, ලිපි, වාර්තා සහ බහුමාධ්‍ය අන්තර්ගතයන් ඇතුළු ව උසස් තත්ත්වයේ අන්තර්ගතයන් නිර්මාණය කිරීම අධීක්ෂණය කිරීම. සියලුම මාධ්‍ය අන්තර්ගතයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශවලට අනුකූල වන බවට සහ ඉලක්කගත ග්‍රාහක පර්ශ්වයන් වෙත ප්‍රධාන පණිවුඩ ඵලදායී ලෙස ලබා දෙන බවට වග බලා ගැනීම.
- **ඩිජිටල් සන්නිවේදනය සහ සමාජ මාධ්‍ය:** වෙබ් අඩවි කළමනාකරණය, සමාජ මාධ්‍යයන්හි නියැලීම සහ විද්‍යුත් තැපැල් සන්නිවේදන ඇතුළුව ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ඩිජිටල් සන්නිවේදන උපායමාර්ග සඳහා නායකත්වය ලබා දීම. සන්නිවේදන උපාය මාර්ග දැනුම් දීමට සහ මහජනයා සමඟ අර්ථවත් ආකාරයෙන් සම්බන්ධ වීමට මංගත සංවාද හා ප්‍රවණතා අධීක්ෂණය කිරීම.
- **ඇගයීම:** සන්නිවේදන මූලාරම්භයන්වල සඵලදායීත්වය තක්සේරු කිරීම සඳහා ප්‍රමිතික සහ ප්‍රධාන කාර්යසාධක දර්ශක (KPIs) පිහිටු වීම. වැඩිදියුණු කිරීම සහ ප්‍රශස්තකරණය සඳහා ක්ෂේත්‍ර හඳුනා ගැනීමට සන්නිවේදන ප්‍රයත්නයන් නිතිපතා විශ්ලේෂණය කිරීම සහ ඇගයීම.

## 2.0 අවශ්‍ය අවම අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද:

### 2.1 අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් :

ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන දේශීය හෝ විදේශීය විශ්වවිද්‍යාලයකින් ලබා ගත් සන්නිවේදන, මහජන සබඳතා, ජනමාධ්‍යය හෝ ආශ්‍රිත ක්ෂේත්‍රයකින් විශේෂිත ප්‍රථම උපාධියක් (අවම වශයෙන් වසර (03)ක) හෝ ශාස්ත්‍රපති උපාධියක් (අවම වශයෙන් වසර (01)ක).

ආර්ථික විද්‍යාව, මූල්‍ය හෝ අලෙවිකරණයට අදාළ ව පශ්චාත් උපාධියක් හෝ වෘත්තීය සුදුසුකමක් තිබීම අමතර සුදුසුකමක් වනු ඇත.

### 2.2 පළපුරුද්ද :

මූල්‍ය ආයතනයක, මහ බැංකුවක, රජයේ නියෝජිත ආයතනයක හෝ නියාමන ආයතනයක ජ්‍යෙෂ්ඨ සන්නිවේදන භූමිකාවකින් ලබා ගත් අවම වශයෙන් වසර දහයක (10) පළපුරුද්ද.

### 2.3 යෝග්‍යතාවය සඳහා අමතර කුසලතා :

- විවිධ ග්‍රාහක පර්ශ්වයන් වෙත සංකීර්ණ තොරතුරු පැහැදිලි ලෙස සහ බලපෑමක් ඇති කරන ආකාරයේ පණිවුඩ බවට පත්කිරීමේ හැකියාව සමග විශිෂ්ට ලිඛිත හා වාචික සන්නිවේදන කුසලතා.
- මාධ්‍ය විමසීම්, සම්මුඛ සාකච්ඡා සහ මාධ්‍ය සාකච්ඡා සාර්ථකව කළමනාකරණය කිරීමේ පළපුරුද්දක් සහිත ශක්තිමත් මාධ්‍ය සම්බන්ධතා කෙරෙහි ඇති විශේෂඥතාවය.
- සංවිධානාත්මක අරමුණු සමඟ අනුකූල වන විස්තීර්ණ සන්නිවේදන උපාය මාර්ග සංවර්ධනය කිරීමට සහ ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇති උපායමාර්ගික චින්තකයෙකු වීම.
- පීඩනය යටතේ වුව ද සන්සුන් ව හා නොසැලී කටයුතු කිරීමට ඇති හැකියාව සහ අභියෝගාත්මක අවස්ථාවන්හි දී සන්නිවේදනය ඵලදායී ලෙස කළමනාකරණය කිරීමට ඇති හැකියාව සමග අර්බුද සන්නිවේදනයෙහි පළපුරුද්ද.
- කණ්ඩායම් දිරිමත් කිරීමේ සහ අභිප්‍රේරණ හැකියාව, සහයෝගීතාවය වැඩිදියුණු කිරීම සහ ප්‍රතිඵල ලබා ගැනීමේ හැකියාව සමග පිළිබිඹු කළ නායකත්ව කුසලතා.
- ඩිජිටල් ප්‍රවණතා සහ මනා පරිචයන් පිළිබඳ පැහැදිලි අවබෝධයක් සහිත ව, ඩිජිටල් සන්නිවේදන මෙවලම් හා සමාජ මාධ්‍ය පිළිබඳ ප්‍රවීණතාව.
- සන්නිවේදන මූලාරම්භයන්වල බලපෑම මැනීමට හා ඇගයීමට සහ දත්ත මත පදනම් වූ තීරණ ගැනීමේ හැකියාව සහිත විශ්ලේෂණාත්මක චින්තනයක් සතු වීම.
- සෑම තරාතිරමකම විවිධ පාර්ශවකරුවන් සමඟ සබඳතා ගොඩනඟා ගැනීමට සහ පවත්වා ගැනීමට හැකියාව ඇති, ශක්තිමත් අන්තර් පුද්ගල කුසලතා.
- සියලුම සන්නිවේදන කටයුතුවල දී අවංකභාවය, විනිවිදභාවය සහ වෘත්තීයභාවය සඳහා කැපවීම.

**අයදුම්පත සමග අධ්‍යාපනික/ වෘත්තීය සුදුසුකම් සහ සේවා පළපුරුද්ද සනාථ කිරීමට අදාළ සහතිකවල ඡායා පිටපත් යොමු කිරීමට අයදුම්කරුවන් විසින් වග බලා ගත යුතුය. ඉහත ලියකියවිලිවල ඡායා පිටපත් අමුණා නොමැති අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක දී ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.**

## 3.0 රැකියාව :

කොන්ත්‍රාත් පදනම මත වසර තුනකට (03) නොවැඩි කාලයක් සඳහා බඳවා ගැනේ. ආරම්භයේ දී වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් ගිවිසුම් අත්සන් කරනු ලබන අතර, වසර අවසානයේ දී සේවා ගිවිසුම දීර්ඝ කිරීමට සලකා බලනු ඇත.

## 4.0 වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ :

සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සඳහා දායකත්වය සහිත ව ක්ෂේත්‍රයේ මේ හා සමාන තනතුරුවලට ගෙවනු ලබන වැටුපට සමගාමී ව ආකර්ෂණීය වැටුපක් ලබා දෙනු ඇත. (වැටුප සාකච්ඡා කොට තීරණය කරගත හැකිය)

## තෝරා ගැනීමේ ක්‍රමවේදය

අපේක්ෂකයින් සම්මුඛ පරීක්ෂණ එකක් හෝ කිහිපයක් මගින් තෝරා ගැනෙනු ඇත.

## අයදුම්පත්

අයදුම්පතෙහි නියමිත ආකෘති පත්‍රය, https://www.cbsl.gov.lk/en/careers යන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියෙන් ලබා ගත හැකි ය. නියමිත ආකෘතියට අනුව සකස් කළ අයදුම්පත් පමණක් ඉදිරිපත් කිරීමට අයදුම්කරුවන් වග බලා ගත යුතු අතර සියලු ලිපි ලේඛන සහිතව නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2024.07.15 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ/මානව සම්පත් වෙත ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය. අයදුම්පත් එවීමේදී “ප්‍රධාන සන්නිවේදන නිලධාරී තනතුර (කොන්ත්‍රාත් පදනම මත)” යනුවෙන් ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ පැහැදිලිව සඳහන් කළ යුතු ය.

අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට අපේක්ෂිත සුදුසුකම් සම්පූර්ණ කර නොමැති තැනැත්තන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් නොලබන අතර අවශ්‍ය සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සහතිකපත්‍රවල මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන් කවර හේතුවක් යටතේ හෝ මෙම තනතුර සඳහා සුදුසුකම්ලත් අපේක්ෂකයන් වශයෙන් සලකනු නොලැබේ. තෝරා ගැනීම සඳහා කුමන ආකාරයකින් හෝ බලපෑම් කිරීම හෝ එසේ කිරීමට තැත් කිරීම බඳවා ගැනීම සඳහා නුසුදුසුකමක් වේ. බඳවා ගැනීම කල් දැමීම හෝ අවලංගු කිරීමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු ය. බඳවාගැනීමේ නිර්ණායක අනුව සුදුසුකම් ලබන අපේක්ෂකයන් පමණක් බඳවා ගැනීමේ ක්‍රියාවලියේ ඊළඟ පියවර සඳහා සළකා බලනු ලැබේ.

**අධ්‍යක්ෂ – මානව සම්පත්**
**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.**
**දුරකථනය : 011-2477330 ෆැක්ස් : 011-2477715**